# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2012 අංක 19 දරන පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 අගෝස්තු මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## 2012 අංක 19 දරන පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වැනි දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී.) 21/2011

### පිය දසුන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"පිය දසුන පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන සංගමයක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ සංගමයේ, පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2012 අංක 19 දරන පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පිය දසුන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" වශයෙන් හඳුන්වනු ලබන) "පිය දසුන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. පිය දසුන පදනම සංස්ථාගත කිරීම.

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ජාතියේ සංවර්ධනය උදෙසා ශ්‍රී ලාංකික තරුණයන්ගේ උපරිම සහ විශිෂ්ටතම සේවාවන් ලබා ගැනීමේ අරමුණින්

2-PL 006103 -2,590 (2011/06)

ඔවුන්ගේ වෘත්තීයමය නිපුනතා වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය අධ්‍යාපනය, පුහුණුව සහ සහයෝගය ලබා දීම;

(ආ) ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස් සහ මහජනතාව අතර සාමය, හොඳ හිත සහ සමගිය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ දුප්පත් සහ අසරණ ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව සහ මුදල් ආධාර ප්‍රදානය කිරීම;

(ඈ) විශේෂයෙන්ම ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා, ප්‍රධාන වශයෙන් ගම්බද ප්‍රදේශවල ස්ථිර හා ජංගම පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම;

(ඉ) මූලික මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය වැනි සංකල්ප ශ්‍රී ලාංකිකයන් අතර ප්‍රවර්ධනය කිරීමේ අදහස ඇතිව එම සංකල්ප පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම;

(ඊ) ළමයින්, කාන්තාවන් සහ ආබාධිත තැනැත්තන් වැනි සමාජයෙන් කොන් වූ තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(උ) ළමයින්ගේ සහ තරුණයන්ගේ නිපුනතා, දක්ෂතා මෙන්ම ඔවුන්ගේ කැමැත්ත අනුව ඔවුන් අතර ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය අනුග්‍රහයන් ලබා දීම;

(ඌ) අවතැන් වූ තැනැත්තන් ඇතුළු ශ්‍රී ලංකාවේ දුප්පත් හා අසරණ පුද්ගලයන් සඳහා නිවාස, වෛද්‍යාධාර, දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් වැනි විවිධ මානුෂීය ආධාර වැඩසටහන් සකස් කොට ක්‍රියාත්මක කිරීම;

(එ) ශ්‍රී ලාංකීය තරුණයින්ගේ සදාචාරාත්මක ගුණධර්ම වැඩිදියුණු කිරීම සඳහා විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් සකස් කොට ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් අභිවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම; සහ

(ඒ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති වෙනත් දේශීය හා විදේශීය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

(2) සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය හෝ දේශපාලන මත අනුව වෙනස්කමකට භාජනය නොකිරීමට සංස්ථාව වගබලා ගත යුතු ය.

යම් අමාත්‍යාංශයක, ආදියෙහි වැඩ සටහන් සමග ගැටුමක් ඇති නොවන බවට සංස්ථාව වගබලා ගත යුතු බව.

4. රාජ්‍ය හෝ පළාත් සභා අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් ඉටු කරනු ලබන යම් ව්‍යාපෘතියක් සංස්ථාවේ වැඩකටයුත්තක් අතර ගැටුමක් ඇති නොවන පරිදි සංස්ථාව විසින් එහි අරමුණු ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ සියලුම අරමුණු හෝ යම් අරමුණක් ප්‍රවර්ධනය කිරීම හෝ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ උපයෝගී වන සියලු ක්‍රියා සහ කාරණා, ඉටු කිරීමේ, කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය ඇතුළුව පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාව සතු ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම, අළුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකට ලබා ගැනීම;

(ආ) ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ඉපැයීම සහ ප්‍රදාන, ත්‍යාග හෝ මුදලින් හෝ අන්‍යාකාරයකින් වූ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සංස්ථාව විසින් මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ණ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඈ) රජයේ හෝ රාජ්‍ය නොවන සංවිධාන සමග හෝ ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත වෙනත් යම් තැනැත්තකු හෝ ආයතනයක් සමග කොන්ත්‍රාත්, හවුල් ව්‍යාපාර හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල් විධායක කමිටුව විසින් තීරණය කරන පරිදි ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාවට නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් පිළිබඳ විනය පාලනය සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි වැටුප් දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(උ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශවල දී පුද්ගලයන් පුහුණු කිරීම;

(ඌ) සංස්ථාවේ අරමුණු නිසි පරිදි හා ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ උපයෝගී වන සියලු දේ කිරීම;

සංස්ථාවේ විධායක කමිටුව.

**6.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නිලතල දරන්නන් සංඛ්‍යාවකින් සමන්විත වන විධායක කමිටුවක් විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) විධායක කමිටුවේ එක් සාමාජිකයකු සමාජ සේවා විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

නිලයට වඩා අඩු නොවන නිලයකට අයත් නිලධරයකු විය යුතු අතර, ඔහු එම අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ විධායක කමිටුව සෑම වසරකම පවත්වනු ලබන සංස්ථාවේ මහා සභා රැස්වීමක දී තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ පළමුවන විධායක කමිටුව මේ පනත ආරම්භ වීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත තෝරා පත් කර ගත යුතු ය.

(5) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන පදනමේ විධායක කමිටුව, සංස්ථාවේ පළමු විධායක කමිටුව තෝරා පත්කර ගන්නා තුරු සංස්ථාවේ විධායක කමිටුව ලෙස කටයුතු කළ යුතු ය.

(6) (අනුශාසකවරුන් ඇතුළු) සංස්ථාවේ නිලතල දරන්නන් ඔවුන්ගේ ජීවිත කාලය සඳහා ම තෝරා පත්කර නොගත යුතු ය.

7. (1) සංස්ථාව විසින් කලින් කළ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු;

(ආ) සංස්ථාවේ විධායක කමිටුවේ නිලතල දරන්නන් තෝරා පත්කර ගැනීම, නිලය අත්හැරීම හෝ නිලයෙන් ඉවත් කිරීම සහ නිලතල දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) විධායක කමිටුවේ, සංස්ථාවේ හෝ එහි උප කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය, එවැනි රැස්වීම්වල පුරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, එහි ගණපූරණය සහ ක්‍රියා පිළිවෙත;

(ඉ) විධායක කමිටුවෙහි සහ සංස්ථාවෙහි සාමාජිකයන්ගේ සුදුසුකම් සහ අශක්නුතාවයන්; සහ

(ඊ) සංස්ථාවෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සහ එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා හෝ එය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාවට ලැබුණ සියලු මුදල් විධායක කමිටුව විසින් අනුමත කරනු ලබන බැංකු එකක හෝ වැඩි ප්‍රමාණයක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

9. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයන් දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුත් එවැනි ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි ලැබීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපලක් අත් කර ගැනීමට හා දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපල සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද 7 වන වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීතිවලට යටත් ව දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව ලාභ නොලබන ආයතනයක් විය යුතු බව.

12. සංස්ථාව ලාභ නොලබන ආයතනයක් විය යුතු අතර සංස්ථාවේ යම් ප්‍රතිලාභ, ලාභ හෝ ලාභාංශවල කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

13. (අ) සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු එහි ණය සහ වගකීම් ගෙවා නිම කිරීමෙන් පසු යම් දේපලක් ඉතිරිව ඇත්නම් එකී දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා හරිනු නොලැබිය යුතු අතර, එකී දේපල සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති සහ එහි රීති අනුව එහි ආදායම හෝ දේපල සාමාජිකයන් අතර බෙදා හැරීම තහනම් කර ඇති වෙනත් යම් ආයතනයක් හෝ ආයතන වෙත පවරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ කාර්ය සඳහා සංස්ථාව විසුරුවා හැරීමට පෙර එකී උචිත ආයතනය හෝ ආයතන සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

14. විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම් ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.